සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

248096

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සිදුහත් කුමාරයා උපත ලැබුවේ කොසොල් රටට අයත් ශාක්‍ය ජනපදයේ අගනුවර වූ,
(1) දෙව්දහ නුවර ය. (2) සැවැත් නුවර ය.
(3) කපිලවස්තු පුරයෙහි ය. (4) කිඹුල්වත් නුවර ය.

**2.** සිදුහත් කුමාරයා අනාගතයේ බුදුවන බවට අනාවැකියක් පළමුවරට ප්‍රකාශ කළේ,
(1) අසිත තවුසා ය. (2) ආලාර කාලාම තවුසා ය.
(3) කොණ්ඩඤ්ඤ බමුණා ය. (4) උද්දකරාමපුත්ත තවුසා ය.

**3.** සිදුහත් කුමාරයා ඉපිද පස්මසක් ගතවූ පසු පැවැති වප්මඟුල් උත්සවයේ දී එතුමා වැඩූ භාවනාව වන්නේ,
(1) මෛත්‍රී භාවනාවයි. (2) ආනාපානසති භාවනාවයි.
(3) අසුභ භාවනාවයි. (4) මරණානුස්සති භාවනාවයි.

**4.** ගිහිගෙය අතහැර පැවිදි වූ සිදුහත් තාපසතුමා ආචාර්යවරුන් සොයා යන අතරමග දී එතුමාට හමු වූයේ,
(1) කොසොල් රජතුමා ය. (2) අජාසත් රජතුමා ය.
(3) බිම්බිසාර රජතුමා ය. (4) උදේනි රජතුමා ය.

**5.** බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්‍ය සත්‍යයේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අන්තර්ගත සාරගර්භ කරුණු අභිබවා යන වෙනත් කිසිම ආගමික ඉගැන්වීමක් නැතැයි පැවසුවේ,
(1) එච්. ජී. වේල්ස් ය. (2) එඩ්වින් අර්නෝල්ඩ් ය.
(3) රීස් ඩේවිඩ්ස් ය. (4) විල්හෙල්ම් ගයිගර් ය.

**6.** බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු සත්වෙනි සතිය ගත කළේ,
(1) රුවන්ගෙහි ය. (2) අජපාල නුගරුකමුල ය.
(3) මුචලින්ද නාරජ සෙවණෙහි ය. (4) රාජායතන කිරිපලු නුගරුකමුල ය.

**7.** තමන් වහන්සේ අවබෝධ කළ ධර්මය ගැඹුරු බවත් කෙලෙස් හරිත සාමාන්‍ය ජනයාට අවබෝධ කළ නොහැකි බවත් මෙනෙහි කරමින් සිටි බුදුරජාණන් වහන්සේට ධර්මය දේශනා කිරීමට ආරාධනා කළේ,
(1) ගවම්පති මානවකයා ය. (2) හුහුංක බ්‍රාහ්මණයා ය.
(3) සටිකාර මහා බ්‍රහ්මයා ය. (4) සහම්පති මහා බ්‍රහ්මයා ය.

**8.** බුදුරජාණන් වහන්සේ වෙත පැමිණෙන උපාසක උපාසිකාවන්ට දහම් දෙසීමට ගත කළ කාලය, දවස බෙදා ඇති කොටස් පහ අතුරෙන් හැඳින්වෙන්නේ,
(1) පෙර බත් කිස නමිනි. (2) පසු බත් කිස නමිනි.
(3) පෙරයම් කිස නමිනි. (4) මැදියම් කිස නමිනි.

[ දෙවැනි පිටුව බලන්න.

**9.** උරුවෙල කාශ්‍යප ඇතුළු සහෝදරයන් තිදෙනාට ධර්මාවබෝධය ලබා දීමට බුදුරජාණන් වහන්සේ ඔවුන් විසූ ප්‍රදේශයට වැඩම කළහ. මේ පිරිස හැඳින්වෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) උරුවෙල ජනපදයේ ජටිල යන්නයි. (2) විශාලා නුවර ආජීවක යන්නයි.
(3) සේනානි නුවර ජටිල යන්නයි. (4) උරුවෙල ජනපදයේ නිගණ්ඨ යන්නයි.

**10.** බුදුරජාණන් වහන්සේගේ රූපසම්පත්තිය කෙරෙහි ඇති වූ ප්‍රසාදයෙන් උන්වහන්සේ ලඟ පැවිදිව වාසය කළ භික්ෂූන් වහන්සේ,

(1) ධර්මාරාම හිමි ය. (2) වක්කලී හිමි ය.
(3) බක්කුල හිමි ය. (4) ආනන්ද හිමි ය.

**11.** බුදුරජාණන් වහන්සේගේ අවසරය ලබා ගත්, තරුණ බමුණෙක් මාස ගණනක් මුළුල්ලෙහි උන්වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළේ ය. ඔහුගේ නම,

(1) බ්‍රහ්මායු යන්නයි. (2) චංකී යන්නයි.
(3) සෝණදණ්ඩ යන්නයි. (4) අක්කෝසක යන්නයි.

**12.** දානාදි පුණ්‍ය කර්ම පාරමිතාවක් බවට පත් වීමට අවශ්‍ය කරුණු ඇතුළත් **නො වන** පිළිතුර වන්නේ,

(1) එය තෘෂ්ණා මාන වැරදි දෘෂ්ටියෙන් තොරව සිදු කිරීම යන්නයි.
(2) එය කරුණා, උපාය කුසලතා හා නුවණින් යුක්ත වීම යන්නයි.
(3) එය පෞද්ගලික ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රශංසා බලාපොරොත්තු නොවී කිරීම යන්නයි.
(4) එය දිව්‍ය ලෝක මනුෂ්‍ය ලෝක සැප සම්පත් අපේක්ෂාවෙන් සිදු කිරීම යන්නයි.

**13.** පාරමිතා ධර්ම සම්පූර්ණ කරන ආකාරය අනුව සෑම පාරමිතාවක් ම කොටස් **තුනකට** බෙදේ. **ඒවානම්,**

(1) බුදු, පසේබුදු, මහරහත් යන්නයි. (2) තෘෂ්ණා, මාන, දිට්ඨි යන්නයි.
(3) පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී යන්නයි. (4) ස්වාර්ථ, පරාර්ථ, උභයාර්ථ යන්නයි.

**14.** අප මහ බෝසතාණන් වහන්සේ වීර්ය පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය හෙළිවන ජාතක කථාවක් **නම්,**

(1) මඛාදේව ජාතකයයි. (2) වණ්ණුපථ ජාතකයයි.
(3) තේමිය ජාතකයයි. (4) වට්ටක ජාතකයයි.

**15.** සංඝරත්නයේ ගුණ ඇතුළත් වන තැන 'ආරාධනා කොට වැඩමවා සිව්පසය පුද කිරීමට සුදුසු' යන ගුණය ප්‍රකාශ වන්නේ,

(1) සාමීචිපටිපන්න යන්නෙනි. (2) ආහුණෙය්‍ය යන්නෙනි.
(3) පාහුණෙය්‍ය යන්නෙනි. (4) දක්ඛිණෙය්‍ය යන්නෙනි.

**16.** තෙරුවන් ගුණ පිළිබඳ මනා අවබෝධය තුළින් ඇතිවන පැහැදීම බුදු දහමේ හඳුන්වන්නේ,

(1) භක්තිය ලෙසයි. (2) අමූලිකා සද්ධා ලෙසයි.
(3) ආකාරවතී සද්ධා ලෙසයි. (4) ප්‍රසාදය ලෙසයි.

**17.** පුද්ගල සිතෙහි පවත්නා සියලු කෙලෙසුන් නැති කිරීමෙන් උපදවා ගන්නා ඥානය බුදු දහමේ හඳුන්වන්නේ,

(1) ආසවක්ඛය ඥානය නමිනි.
(2) මාර්ග ඥානය නමිනි.
(3) දිබ්බසෝත ඥානය නමිනි.
(4) චේතෝපරියාය ඥානය නමිනි.

**18.** විවිධ අරමුණු කරා ගමන් ගන්නා වෙනස් වන චංචල සිත එක අරමුණක පිහිටුවා ඒකාග්‍රතාව ඇති කර ගැනීමට ඉවහල් වන භාවනාව හැඳින්වෙන්නේ,

(1) සමථ භාවනාව නමිනි. (2) විදර්ශනා භාවනාව නමිනි.
(3) කමටහන් භාවනාව නමිනි. (4) ධ්‍යාන භාවනාව නමිනි.

**19.** "ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති" යන ගාථා පාඨයෙන් පැහැදිලි වන්නේ,

(1) ලෝකයේ ඇලී ගැලී නොසිටිය යුතු බවයි.
(2) ගැටුම්වලින් තොරව සාමකාමීව ජීවත්වීමේ වටිනාකමයි.
(3) අටලෝ දහමෙන් නොසැලී සිටිය යුතු බවයි.
(4) සිත අකෝප්‍යව තබා ගත යුතු බවයි.

The National e-Learning Portal for The General Education

20. සිතේ නොසන්සුන් ගතිය හා කළ නරක හා නොකළ හොඳ පිළිබඳ පසුතැවිලි වීමේ ගතිය ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) ව්‍යාපාදය ලෙසයි. (2) ථීනමිද්ධ ලෙසයි.
(3) උද්ධච්ච කුක්කුච්ච ලෙසයි. (4) විචිකිච්ඡා ලෙසයි.

21. අසවලා මට බැන්නේ ය. පහර දුන්නේ ය. ආදී වශයෙන් ක්‍රෝධ නොකරන්නාගේ වෛරය සංසිඳෙන බව අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "නහි වෙරෙන වෙරානි - සම්මන්තීධ කුදාචනං" යන්නයි.
(2) "සාරංච සාරතො ඤත්වා - අසාරංච අසාරතො" යන්නයි.
(3) "චරං චෙ නාධිගච්ඡෙය්‍ය - සෙය්‍යං සදිසමත්තනො" යන්නයි.
(4) "අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ" යන්නයි.

22. කාමය, හිංසනය හා දැඩි ක්‍රෝධය පිළිබඳ සංකල්පනාවලින් බැහැරවීම අරි අටගිමගෙහි හැඳින්වෙන්නේ,
(1) සම්මා දිට්ඨි වශයෙනි. (2) සම්මා සංකප්ප වශයෙනි.
(3) සම්මා කම්මන්ත වශයෙනි. (4) සම්මා ආජීව වශයෙනි.

23. 'භෝග අපාය මුඛ' හෙවත් පුද්ගලයා ඉපයූ වස්තුව විනාශ වන දොරටු හයට ඇතුළත් **නො වන** කරුණ වන්නේ,
(1) සොරකම් කිරීම යන්නයි. (2) මත් පැන් පානය යන්නයි.
(3) සූදුවට ලොල් වීම යන්නයි. (4) පාපමිත්‍ර ඇසුර යන්නයි.

24. භාවනාව සඳහා යොමුවීමේ දී හිඳීම, සිටීම, ඇවිදීම ආදී සියලු ක්‍රියා සිහියෙන් හා දැනීමෙන් යුතුව සිදු කිරීම ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) ආයති සංවරය නමිනි. (2) සති සම්පජඤ්ඤ නමිනි.
(3) සන්තුට්ඨිතා නමිනි. (4) ජාගරියානුයෝගය නමිනි.

25. "ඉපිද මැරේ යළි ඉපිදේ නොතිර සසර සාගරේ" යන ගී පදවලින් හෙළිවන්නේ සත්ත්වයින් සසර මැරෙමින් ඉපිදෙමින් භවගාමී වන අයුරු බව පැහැදිලි කළ ගුරුතුමිය බුදුරජාණන් වහන්සේට මෙම තත්ත්වය දකින නුවණක් පැවැති බවද පැවසුවා ය. එම ඥානය හැඳින්වෙන්නේ,
(1) ආසවක්ඛය නමිනි. (2) පුබ්බේනිවාසානුස්සති නමිනි.
(3) චුතූපපාත නමිනි. (4) දිබ්බචක්ඛු නමිනි.

26. නිවන් මග අහුරාලන, සිත සංවර කිරීමට බාධාවන කරුණු පහක් බුදු දහමේ ඉගැන්වෙන්නේ,
(1) පංච නියාම ධර්ම නමිනි. (2) පංච උපාදාන නමිනි.
(3) පංච නීවරණ නමිනි. (4) පංච ස්කන්ධ නමිනි.

27. විපාක දීමට ඉදිරිපත් වන අනුපිළිවෙළ අනුව සිව් ආකාර වන කර්ම අතුරෙන් බලවත් චේතනා ශක්තියකින් තොරව සිදු කරන කර්මය හැඳින්වෙන්නේ,
(1) ගරුක කර්ම ලෙස ය. (2) ආසන්න කර්ම ලෙස ය.
(3) ආචිණ්ණ කර්ම ලෙස ය. (4) කටත්තා කර්ම ලෙස ය.

28. විපාක දෙන කාලය අනුව සතර ආකාර වන කර්ම අතුරෙන් විපාක දීමට අවස්ථාවක් **නොලබන** කර්මය ධර්මයේ විස්තර වන්නේ,
(1) ජනක කර්ම වශයෙනි. (2) දිට්ඨධම්මවේදනීය කර්ම වශයෙනි.
(3) උපපජ්ජවේදනීය කර්ම වශයෙනි. (4) අහෝසි කර්ම වශයෙනි.

29. වළගම්බා රජතුමා තමන්ට උපකාර කළ මහාතිස්ස හිමියන්ට අභයගිරි විහාරය කරවා පෞද්ගලිකව පූජා කිරීම නිසා ලංකා ශාසන ඉතිහාසයේ සිදු වූ වැදගත් ම ශ්‍රී ලාංකේය කරුණ **නො වන්නේ,**
(1) පිරිස කොටස් දෙකකට බෙදී යාමයි.
(2) භික්ෂුවක සංඝ සමාජයෙන් ඉවත් කිරීමයි.
(3) මහා විහාරයට රාජානුග්‍රහය නොලැබී යාමයි.
(4) විනය සංගායනාවක් සිදු වීමයි.

068096

30. ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා උපදෙස් ලබා දෙන කරුණු අතරට අයත් **නො වන්නේ,**
(1) සප්ත අපරිහානීය ධර්ම යන්නයි. (2) දස සක්විතිවත් යන්නයි.
(3) දස රාජධර්ම යන්නයි. (4) සතර උපාදාන යන්නයි.

31. "සබ්බෙ මනුස්සා මම පජා" "සියලු මිනිස්සු මාගේ දරුවෝ ය" යන ප්‍රතිපදාව මුල් කොට ගෙන තම රාජ්‍ය පාලනය ගෙන ගිය රජතුමා,
(1) බිම්බිසාර ය. (2) අජාසත්ත ය. (3) කොසොල් ය. (4) ධර්මාශෝක ය.

32. කාලාම සූත්‍රයේ දී යමක් නොපිළිගත යුතු යයි දේශනා කළ කරුණු අතරට ඇතුළත් **නො වන්නේ,**
(1) පරම්පරාගතව පැවතෙන විශ්වාසයක් නිසා නොපිළිගත යුතු ය යන්නයි.
(2) පූජනීය ග්‍රන්ථයක සඳහන් වීම නිසා නොපිළිගත යුතු ය යන්නයි.
(3) ප්‍රකාශ කරන පුද්ගලයා තම ශිෂ්‍යයකු නිසා නොපිළිගත යුතු ය යන්නයි.
(4) තමා පිළිගත් දෘෂ්ටිය හා ගැළපෙන නිසා නොපිළිගත යුතු ය යන්නයි.

33. බෞද්ධ සාහිත්‍යය පිළිබඳ පාඩම නිමා කළ ගුරුතුමිය සමාජ යහපත සඳහා සදුපදේශ ලබාදීමේ අරමුණින් ලියූ උපදේශ කාව්‍ය ග්‍රන්ථ **තුනක්** නම් කරන ලෙස දැන්විය. නම් කරන ලද නිවැරදි කාව්‍ය ග්‍රන්ථ තුන වන්නේ,
(1) ලෝකෝපකාරය, කාව්‍යශේඛරය හා කව්සිළුමිණ යන්නයි.
(2) ලෝවැඩ සඟරාව, සසදාවත හා බුදුගුණාලංකාරය යන්නයි.
(3) ලෝවැඩ සඟරාව, සිදත් සඟරාව හා ගුත්තිලය යන්නයි.
(4) ලෝවැඩ සඟරාව, සුභාෂිතය හා ලෝකෝපකාරය යන්නයි.

34. කෝට්ටේ යුගයේ සාහිත්‍යකරණයෙහි නියැළුණු තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් කාව්‍යශේඛරය ලිවීමට පාදක කොට ගත් ජාතක කථාව වන්නේ,
(1) මඛාදේව ජාතකයයි. (2) සත්තුභත්ත ජාතකයයි.
(3) සස ජාතකයයි. (4) ලෝමහංස ජාතකයයි.

35. පොළොන්නරු යුගයේ ගුරුළුගෝමි පඬිතුමා විසින් රචිත ග්‍රන්ථ **දෙකක්** වන්නේ,
(1) ධර්මප්‍රදීපිකාව හා අමාවතුර ය. (2) අමාවතුර හා සද්ධර්ම රත්නාවලිය ය.
(3) ධර්ම ප්‍රදීපිකාව හා සද්ධර්මාලංකාරය ය. (4) දම්පියා අටුවා ගැටපදය හා සිඛවලඳ විනිස ය.

36. හිටි පිළිම, හිඳි පිළිම හා සැතපෙන පිළිම යන ඉරියව් තුනෙන් ම යුත් පිළිම දක්නට ලැබෙන්නේ,
(1) පොළොන්නරුවේ තිවංක පිළිම ගෙහි ය. (2) පොළොන්නරුවේ ගල් විහාරයේ ය.
(3) වැල්ලවායේ බුදුරුවගල ය. (4) අනුරාධපුරයේ අභයගිරියේ ය.

37. අනුරාධපුර අධ්‍යයන චාරිකාව නිම කළ ගුරුතුමා සිංහල කැටයම් ශිල්පියාගේ විශිෂ්ට කලා කුසලතාව පෙන්නුම් කරන නිර්මාණයකට නිදසුනක් දක්වන ලෙස දැන්විය. ඔවුන් විසින් පෙන්වා දෙන ලද නිවැරදි නිදසුන වන්නේ,
(1) ස්තූපය වට කොට සෑදූ වටදාගෙය යන්නයි.
(2) ථූපාරාමය වටා ඇති ගල් කණු පෙළ යන්නයි.
(3) අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල ඇති සඳකඩ පහණ යන්නයි.
(4) අනුරාධපුරයේ පිහිටි කුට්ටම් පොකුණ යන්නයි.

38. බුදු දහමට අනුව මනුෂ්‍යයා සැකසී ඇත්තේ ස්කන්ධ පහක එකතුවෙනි. එකී පංචස්කන්ධය හැඳින්වෙන්නේ,
(1) රූප, ශබ්ද, ගන්ධ, රස හා ස්පර්ශ නමිනි.
(2) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර සහ විඤ්ඤාණ නමිනි.
(3) පඨවි, ආපෝ, තේජෝ, වායෝ සහ ආකාස නමිනි.
(4) චක්ඛු, සොත, ඝාන, ජිව්හා සහ කාය නමිනි.

39. ධර්ම දේශනය සඳහා වැඩම කළ ගරු ස්වාමීන් වහන්සේ පැහැදිලි කළේ බෞද්ධයා ආගමික ධනයෙන් පොහොසත් විය යුතු ආකාරය පිළිබඳවයි. උන්වහන්සේගේ ධර්ම දේශනයට පාදක වූයේ,
(1) ධනවත් වීම පිළිබඳවයි. (2) ධනය පරිභෝජනය පිළිබඳවයි.
(3) ශ්‍රද්ධාව පිළිබඳවයි. (4) භාවනාව පිළිබඳවයි.

40. සප්ත අපරිහානිය ධර්මවලට අයත් **නො වන** කරුණක් වන්නේ,
(1) නිතර රැස්වීම යන්නයි. (2) සමගිව රැස්ව සමගිව විසිර යාම යන්නයි.
(3) පෙර නොපැවති නීති පැනවීම යන්නයි. (4) කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම යන්නයි.

**

[ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය කෙටියෙන් පහදන්න.
(ii) පස්වග තවුසන් අර්හත්වයට පත්වූයේ කවර සූත්‍ර දේශනාවක් ශ්‍රවණය කිරීමෙන් ද?
(iii) 'සබ්බ පාපස්ස අකරණං – කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං – එතං බුද්ධානසාසනං' මෙම ගාථාවේ අදහස ලියන්න.
(iv) "දානං සීලං පරිච්චාගං" යනාදි ගාථාවෙන් දැක්වෙන්නේ කවර කරුණු ද?
(v) "ඝණ්ඨාකාර, සටාකාර" යන වචන දෙකේ සිංහල අදහස ලියන්න.
(vi) "චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය, බහුජන සුඛාය". බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළේ කවුරුන් හට ද?
(vii) "බුදුරජාණන් වහන්සේගේ ජීවිතය පද්මාකාර වේ". එහි අදහස පහදන්න.
(viii) සතර අගති නම් කරන්න
(ix) "අනවජ්ජ සුඛ" කෙටියෙන් පැහැදිලි කරන්න.
(x) හෙළ අටුවා (සීහලට්ඨ කථා) යනු මොනවා ද?

**2.** (i) මහාභිනිෂ්ක්‍රමණය කළ සිදුහත් තාපසතුමා පළමුව සත්‍යය සොයා ගිය ආචාර්යවරුන් දෙදෙනාගේ නම් ලියන්න.
(ii) භික්ෂු පිරිස ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.
(iii) බුද්ධ චරිතයෙන් ශිෂ්‍ය ජීවිතවලට ගත හැකි ආදර්ශ පැහැදිලි කරන්න.

**3.** (i) සිගාල ගෘහපති පුත්‍රයාට ගෘහ ජීවිතය පිළිබඳ කරුණු පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර දේශනාව කුමක් ද?
(ii) "මාතා පිතා දිසා පුබ්බා" යනාදි ගාථාවෙන් පැහැදිලි කෙරෙන පරිදි අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කළ යුතු සමාජ කණ්ඩායම් **හය** දක්වන්න.
(iii) සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පදනම බුදු දහමෙන් ඉගැන්වෙන ආකාරය පැහැදිලි කරන්න.

**4.** (i) යසස වැඩීමට ඉවහල්වන කරුණු ඇතුළත් ධම්මපද ගාථාව ලියන්න.
(ii) එම ගාථාවේ දැක්වෙන යසස වැඩීමට ඉවහල්වන දහම් කරුණු ලියන්න.
(iii) පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක් කරන්න.

**5.** (i) "යො පටිච්චසමුප්පාදං පස්සති, සො ධම්මං පස්සති." මෙහි අර්ථය පැහැදිලි කරන්න.
(ii) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්න ධර්මානුකූලව විස්තර කරන්න.
(iii) හේතුඵල දහම සසර දුක මෙන්ම සමාජගත දුක ද ඇති වන හා නැති වන ආකාරය පැහැදිලි කිරීමට අදාළ කර ගත හැකි දහමක් ලෙස ඇගයීමට ලක් කරන්න.

**6.** (i) පළමුවන හා දෙවන ධර්ම සංගායනා පැවැත්වූ ස්ථාන නම් කරන්න.
(ii) පළමුවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.
(iii) ධර්ම සංගායනා මගින් ශාසනයේ සුරක්ෂිත බව තහවුරු කරන ලද අයුරු පහදන්න.

**7.** (i) කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන පරිදි මෙත් වඩන්නකු තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** නම් කරන්න.
(ii) මෙත් වැඩිය යුතු ආකාරය පැහැදිලි කරන්න.
(iii) මෙත් වැඩීම සාමකාමී ජන සමාජයක් ඇතිවීම කෙරෙහි බලපාන අයුරු පහදන්න.

* * *